සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி | SAMAGI JANA BALAWEGAYA

2024.09.16

**අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්,**
අගරදගුරු නිවස,
කින්සිපාර,
කොළඹ

අතිඋතුම් හිමිපාණනි,

**<u>පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ට සත්‍ය ලෙසම යුක්තිය ඉටුවේවිද?</u>**

උක්ත මැයෙන් ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න මහතා ඔබ වහන්සේ වෙත යොමුකළ ලිපියක් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වෙමින් පවතියි. එම ලිපියෙහි අඩංගු කරුණු ඔබ වහන්සේ සිදුකළ ප්‍රකාශයක් ලෙස ජාතික ජනබලවේගයට සම්බන්ධ සමාජ මාධ්‍ය ජාලා විසින් ඔබ වහන්සේගේ ඡායාරූපයක්ද සහිතව විකෘති කරන ලද ප්‍රවෘත්තියක්ද පලවෙයි. ඒ පිළිබඳව ඔබ වහන්සේගේ මාධ්‍ය අංශය විසින් නිවැරදි කිරීමක් සිදුකරමින් එය ඔබ වහන්සේ විසින් කළ ප්‍රකාශයක් නොවන බව කළ පැහැදිලි කිරීම පිළිබඳව අපගේ ගෞරවනීය කෘතවේදීත්වය පිරිනමමු.

ජනාධිපති නීතිඥවරයා විසින් ඔබ වහන්සේවෙත යොමුකළ ලිපියෙන් උත්සහ දරා ඇත්තේ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පතිධූරයට පත්වීමේ නඩු කරයට ඉදිරිපත් වූ මැදිහත් පෙත්සම්කරුවෙකු වූ පූජ්‍ය මහාචාර්ය අගලකඩ සිරුසුමන නායක ස්වාමීන් වහන්සේ සජිත් ප්‍රේමදාස මැතිතුමා පිළිබඳව කළ ප්‍රකාශයක් ස්මතුකරමින් සමගි ජන බලවේගය පාස්කු ප්‍රහාරය පිළිබඳව දරන ස්ථාවරය වෙනස් වීමට ඉඩඇති බවට වූ සැකයක් නිර්මාණය කිරීමයි.

ඔබ වහන්සේට පාස්කු ප්‍රහාරයේ විමර්ශන පිළිබඳව අපගේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා ලිඛිතව සහ වාචිකව ලබාදී ඇති ප්‍රතිඥාවන් කිසිලෙසක වෙනස් නොවන බව යළි යළිත් අවධාරණය කරනු කැමැත්තෙමි. ඔබ වහන්සේ වෙත යොමුකොට ඇති ලිපියෙන් රියෙන්සි අර්සකුලරත්න මහතා ඉස්මතු කිරීමට දරන දේශබන්දු තෙන්නකෝන් මහතා පිළිබඳ වූ ප්‍රශ්නය පිළිබඳව සමගි ජන බලවේගයේ ස්ථාවරය පැහැදිලි කරන සහ එම ස්ථාවරය වෙනුවෙන් පෙනී සිටි අවස්ථාවන් ඔබ වහන්සේට සිහිපත් කළ යුතු යැයි මම විශ්වාස නොකරමි.

දේශබන්දු තෙන්නකෝන් මහතා වැඩබලන පොලිස්පතිධූරයට පත් කිරීම, පොලිස්පතිධූරයට පත් කිරීම සිදුකිරීමට වත්මන් ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථාදායක සභාවට යෝජනා කළ අවස්ථාවේ එයට එරෙහිව ව්‍යවස්ථාදායක සභාවේදී ඡන්දය භාවිතා කළේ අප පක්ෂයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා සහ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති කබීර් හෂීම් මැතිතුමායි. එම විරෝධතා නොසලා හරිමින් ඔහු පොලිස්පතිධූරයට පත්කළ විට එයට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේද සමගි ජනබලවේගයයි.

දේශබන්දු තෙන්නකෝන් මහතාට එරෙහිව සමගි ජන බලවේගය ක්‍රියාත්මක වන්නේ පුද්ගලබද්ධ කරුණක් නිසා නොවෙයි. මානවහිමිකම් කඩ කිරීම සම්බන්ධයෙන් පැහැදිලි චූදිතයෙක් වීම , පාස්කු ප්‍රහාරය හා අරගලයට පහරදීම සම්බන්ධයෙන් චෝදනාවට ලක්ව වරදකරුවෙකු වීම තුළ ඔහු පොලිස්පති වැනි තනතුරකට පත්වීම නොසුදුසු වන හෙයිනි.

පුද්ගලික වුවමනා හෝ පුද්ගලික නොතකාහැරීම් නිසා තවමත් පාස්කු ඉරුදින ප්‍රහාරය නොවිසිඳුන ගැටලුවක්ව තිබේ. එනිසාම එයට සම්බන්ධ වූ පුද්ගලයින් නීතියේ රැහැනට හසු කරගැනීමට අපක්ෂපාතී පරීක්ෂණයක් ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව සිදුකළ යුතු බව අප දිගින් දිගටම අවධාරණය කළ කරුණකි.

මේ පිළිබඳව පාර්ලිමේන්තු විවාද දෙකක් පැවැත්වීමටත් , පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මේ වනවිට හෙළිවී ඇති තොරතුරු මහජනතාව හමුවේ නිරාවරණය කිරීමටත් අපි කටයුතු කළෙමු. එමෙන්ම සමගි ජනබලවේගයේ නීතිඥ කණ්ඩායම විසින් අනාගතයේදී මෙම පරීක්ෂණ සිදුකළ යුතු ආකාරය පිළිබඳව සැකසූ ශක්තිමත් යෝජනාමාලාවක් ඔබවහන්සේ වෙත භාරදී ඇත. ඒ පිළිබඳ වූ කැපවීම ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ "සැමට ජයක්" මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ලිඛිතව යළිත් අවධාරණය කර තිබේ. එම ප්‍රතිඥාවන් කිසිලෙසක උල්ලංඝනය නොකරන බව යළිත් ඔබ වහන්සේ වෙත අවධාරණය කරනු කැමැත්තෙමි.

ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න මහතා මෙම කරුණු දැන දැනම වර්තමානයේ ඔහු නියෝජනය කරන දේශපාලනය වෙනුවෙන් මෙවැනි ලිපියක් ඔබ වහන්සේ වෙත යොමු කිරීම අතිශය ඛේදජනක තත්ත්වයකි. පාස්කු ප්‍රහාරය පිළිබඳව අප විසින් කරනු ලැබූ හෙළිදරව් වලදීද සාධනීය මැදිහත්වීමක් නොකළ ජාතික ජන බලවේගය දේශබන්දු තෙන්නකෝන් මහතා වැඩබලන පොලිස්පති සහ පොලිස්පතිධූරයට පත් කිරීමේදීද අනුගමනය කළේ නිහඬ පිළිවෙතක් බව ඔබ වහන්සේද දන්නා කරුණකි.

පාස්කු ප්‍රහාරය සහ දේශබන්ද තෙන්නකෝන් මහතාට එරෙහි නඩුකරය පටවලා ගනිමින් රටතුළ ආගමික සහජීවනය බිඳදැමීමටත් , ආගමික නායකයින් අතර ගැටුමක් නිර්මාණය කිරීමටත් පසුබිම සකසන්නට උත්සහ දරන යටි අරමුණු සහිත මෙම ලිපිය තම ඡන්ද පදනම ශක්තිමත් කිරීමට දරන අතිශය විනාශකාරී උත්සාහයක් ලෙස අපි හෙළා දකින්නෙමු.

**සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.**

ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.

Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.

+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com

ජාතිවාදය , ආගම්වාදය , වර්ගවාදය ප්‍රතික්ෂේප කරන සමගි ජන සන්ධානය මෙරටේ ආගමික සාමාග්‍රීය , වාර්ගික සංහිඳියාව සඳහා වූ කැපවීම යළිත් තහවුරු කරමින් අනාගතයේදී කටයුතු කරන බවත් පාස්කු ප්‍රහාරය පිළිබඳ අපගේ ප්‍රතිඥාවන් එලෙස ක්‍රියාවට නංවන බව ඔබ වහන්සේ වෙත ගෞවරයෙන් දැනුම් දී සිටිමු.

රියෙන්සි අර්සකුලරත්න මහතා ඔබ වහන්සේ වෙත යොමු කළ ලිපිය විවිධ මාධ්‍ය ඔස්සේ හෙළිදරව් කර තිබූ නිසා මෙම ලිපියද මාධ්‍ය වෙත නිකුත් කරන බව කාරුණිකව සඳහන් කරමි.

මෙයට,

රංජිත් මද්දුම බණ්ඩාර
මහලේකම්
සමගි ජනබලවේගය

පිටපත්

1. අති උතුම් හැරල්ඩ් පෙරේරා රදගුරු හිමිපාණන් වහන්සේ - රදගුරු සම්මේලනයේ සභාපති සහ රදගුරු , කුරුණෑගල පදවිය
2. අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන් වහන්සේ- රදගුරු, නුවර පදවිය
3. අති උතුම් රේමන් වික්‍රමසිංහ රදගුරු හිමිපාණන් වහන්සේ -රදගුරු, ගාල්ල පදවිය.
4. අති උතුම් නෝබට් අන්ද්‍රාදි රදගුරු හිමිපාණන් වහන්සේ - රදගුරු,අනුරාධපුර පදවිය
5. අති උතුම් ඉමැනුවල් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන් වහන්සේ - රදගුරු මන්නාරම පදවිය
6. අති උතුම් ජස්ටින් ඥාණප්‍රගාසම් රදගුරු හිමිපාණන් වහන්සේ රදගුරු -යාපනය පදවිය
7. අති උතුම් නොයෙල් ඉමැනුවෙල් රදගුරු හිමිපාණන් වහන්සේ රදගුරු - ත්‍රිකුණාමලය පදවිය

**සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.**
ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.
Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.
+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com

# සමගි ජන බලවේගය

ஐக்கிய மக்கள் சக்தி | SAMAGI JANA BALAWEGAYA


8. අති උතුම් ජූඩ් නිශාන්ත රදගුරු හිමිපාණන් වහනසේ -රදගුරු බදුල්ල පදවිය

9. අති උතුම් විමල් ශ්‍රී ජයසූරිය රදගුරු හිමිපාණන් වහන්සේ රදගුරු- හලාවත පදවිය

10. අති උතුම් වයිමන් කෲස් රදගුරු හිමිපාණන් වහන්සේ - රත්නපුර පදවිය

11. අති උතම් ඇන්ටන් රංජිත් රදගුරු හිමිපාණන් වහන්සේ-ධර්මදූත පාලක,මඩකලපුව පදවිය

12. අති උතුම් මැක්ස්වෙල් සිල්වා රදගුරු හිමිපාණන් වහනසේ උප රදගුරු- කොළඹ පදවිය

13. අති උතුම් ජේ.ඩී.ඇන්තනී රදගුරු හිමිපාණන් වහන්සේ උප රදගුරු-කොළඹ පදවිය

14. සිරිල් ගාමිණී පියතුමා, ප්‍රධාන කතෘ -ඥානාර්ථ ප්‍රදීප සහ කතෝලික පල්ලියේ මාධ්‍ය ප්‍රකාශක.


**සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.**

ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.

Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.

+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com